ඩැඩිහිටියගේ ස්වභාවය



# තන පුඩුවේ හටගන්නා දද **Candida** (අක්කාරම)

## වැදගත් කරුණු

- ඇදුම/දද/ පීනස් රෝගය හා සම්බන්ධයෙන් පෞද්ගලිකව හෝ පවුලේ පුරාවෘත්තයක් ඇති ස්ත්‍රීන්ගේ තන පුඩුවල **candida** ඇතිව හෝ නැතිව දද හට ගත හැක.
- වෙනත් බෝවෙන රෝගයකට ප්‍රතිජීවකයක් රැගෙන ඇත්නම් **candida** ඇතිවිය හැක.
- තන පුඩු සේදීමේදී සබන් පාවිච්චි කිරීමෙන් වලකින්න.
- තනපට නිතර මාරු කරන්න. ප්ලාස්ටික් වලින් තැනූ තන පට පාවිච්චි නොකරන්න
- තනපුඩු වියලි බවට පත්වන්නේ නම් නිතරම තෙත්ව තබා ගැනීම සඳහා **emulsifying** වැනි ආලේපයක් (ඔයින්ට්මන්ට්) එකක් පාවිච්චි කරන්න.
- වෛද්‍යවරයකුගේ ප්‍රතිකාර වලට කෝටිසෝන් (**cortisone**) ක්‍රීම් වර්ග සහ නියමිත ප්‍රති **candida** සම්මිශ්‍රණයක් යන දෙකම අඩංගු කරණු ඇත.
- දද හෝ **candida** ඉවත්වූ විට වුවද තන පුඩු දිගටම තෙත්ව තබා ගැනීමටත් සහ සබන් පාවිච්චි කිරීමෙන් වැලකීමටත් වග බලා ගන්න.

## ඒවා මොනවාද?

Candida හෝ Thrush වනුයේ මුහුන් yeast (Candida albicans) වලින් සමේ ඇතිවන ආසාදනයකි (infection). කෙසේ වෙතත් එය සාමාන්‍ය සමට බලපෑමක් කවදා හෝ ඇති කලත් එයද සිදු වන්නේ කලාතුරකිනි. දැනටමත් කිසියම් ආකාරයකින් අස්වාභාවිකව පවතින සම මත සාමාන්‍යයෙන් ආසාදනය (infection) ඇතිවිය හැක. සාමාන්‍යයෙන් එය හට ගන්නේ සමේ රැලි ගැසී ඇති තෙතමනයත් උෂ්ණත්වයත් රැඳී ඇති ස්ථාන වලය. සමේ චර්ම සහිත (dermatitis) හෝ දද ආශ්‍රිත පදෙස් වල හට ගත කැක.

වඩා බලවත් ප්‍රශ්ණයක් වන්ණේ මව්කිරි දෙන මව්වරුන්ට, කිරි උරන කිරිදරුවා නිසා තෙමුණු සහ වියලි කම සහ නිතරම තෙතමනය සහ උෂ්ණත්ව නිසා සම වියලිවීමයි. තනපුඩු වල පැළීම සහ වේදනා සහිත ඉරිතැලීම් මෑදූ දද තත්වයකට මුල පිරිය හැක. මෙවන් අවස්ථාවකදී candida විසින් ආසාදනය (infect) විය හැකි අතර එය සුදු පැහැති ලකුණු සේ පෙන්නුම් කරයි. ලැම පදෙසේ කැක්කුමක්ද හට ගැනීමට ඉඩ ඇත.

වෙනත් ආසාදනයක් සඳහා ප්‍රතජීවකයක් (antibiotic) ලබා ගෙන ඇති අවස්ථාවක candida ආසාදනය වැඩිවිය හැක. ළදරුවාගේ මුඛේ හටගන්නා candida ආසාදනය හේතුකොට ගෙනද ඇතිවිය හැක.

## එය වැළැක්විය හැක්කේ කෙසේද?

තනපුඩුවල candida වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ගය වනුයේ දද ආශ්‍රිත වියලි කම, පැළීම සක තනපුඩු පිපිරීම වළක්වා ගැනීමයි. සම සේදීමේදී සබන්වලින් සේදීමෙන් වැලකී සිටිය යුතුවේ. තනපුඩු වියලි බවට පත්වන්නේ නම් emulsifying ඔයින්ට්මන්ට්, වෙනත් පැරෆින් (paraffin) පදනම්වූ ඔයින්ට්මන්ට් හෝ ක්‍රීම් වර්ග නැතහොත් නවතම ලැනොලින් අඩංගු නිශ්පාදන තෙමනය රඳවා ගැනීම සඳහා පාවිච්චි කළ යුතුය.

තනපට නිතර මාරු කරන්න. ප්ලාස්ටික් වලින් තැනූ තන පට පාවිච්චි නොකරන්න. තනපුඩු වලට හුලං වැදිමට සැළැස්වීමෙන් පිපිරීම් ඇතිවීම වලක්වා ගත හැක.

## එවාට ප්‍රථිකාර කරන්නේ කෙසේද?

පිපිරීම් සහ පීඩාව ගෙන දෙමින් ඇවිස්සී ඇති තනපුඩු වෛද්‍යවරයකු විසින් නියම කරණු ලවන කෝටිසෝන් (cortisone) ක්‍රීම් වලින් ප්‍රථිකාර කිරීම යෙහෙකි. අක්කාරම thrush වලට ප්‍රථිකාර කිරීම සඳහා විශේෂ ප්‍රති-candida ක්‍රීම් එකතුවද යොදනු ලැබේ. මව්කිරි පෙවීමට පෙර තනපුඩු කුඩා ප්‍රමාණයක aqueous හෝ sorbolene ක්‍රීම් වලින් සෝදා ගත හැක. තත්වය උග්‍ර නම් අදාල තනපුඩුවෙන් දරුවාට කිරි පෙවීම දින කීපයකට නතර කළ යුතුවේ. මෙම කාලය තුළදී අතෙන් හෝ පොම්පයක මාර්ගයෙන් කිරි දොවා ගෙන බෝතලයක් ගෝ වෙනත් සුදුසු මාර්ගයකින් පෙවිය යුතුය.

බීමට ගත් ප්‍රතජීවකයක් (antibiotic) හේතු කොට ගෙන candida හටගෙන ඇත්නම් ප්‍රති-candida බෙතක්ද බීමෙන්ම පාවිච්චි කිරීමට අවශ්‍ය වනු ඇත. බිළිදාගේ මුඛයේ ඇති candida (thrush) වලටද ප්‍රථිකාර කළ යුතුවේ.

Candida සහ දද සුවවූවිට නැවත හට ගැනීම වැළැක්වීම සඳහා තනපුඩුවලට නිතර තෙතමනය ගෙනදෙන දෑ පාවිච්චි කිරීම අවශ්‍යවේ. සබන් පාවිච් කිරීමෙන් වැලකී සිටිය යුතුවේ.

## වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය
ඔබේ ඖශධවේදියා
කිරි දීම හා සම්බන්ධ උපදේශක Lactation Consultant
ඔබේ පවුලේ දොස්තර මයා/මිය
චර්ම විශේෂඥයෙක් (A dermatologist)

මීට සම්බන්ධිත තොරතුරු පත්‍රිකාව ඃ *Candida (Thrush) in Babies*

© 2002, Department of Dermatology, St. Vincent's Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.